

# උමතු චිත්‍රපට රංගනය

දිනුක හිරුෂාන්

විජානගේ ප්‍රකාශන

පෝල් ටූම්බ්ස් සාර්ථක ත්‍රාසජනක නළුවෙක් මෙන්ම තිර රචකයෙකි. ඔහුගේ Death නමැති චිත්‍රපටය ප්‍රදර්ශනය ආරම්භ කරමින් පැවති සාදයේදී  ඔහු එලන් මේසන් සමඟ විවාහ ගිවිස ගැනීම පිළිබඳව නිවේදනය කරයි. කෙසේවෙතත්, එදින සවස් වරුවේ වැඩිහිටි චිත්‍රපට නිෂ්පාදක වරයෙක් වන ඔලිවර් ක්වාල් හෙළි කරන්නේ එලන් මීට පෙර ඔහු වෙනුවෙන් ඔහුගේ චිත්‍රපට සඳහා ද පෙනී සිටි බවයි.



මේ පිළිබඳව තොරතුරු සැලවූ ටූම්බ්ස් එලන් සමග බහින් බස් වේ. කෝපාවිෂ්ඨ වූ ටූම්බ්ස්ගේ ප්‍රතිචාර ගැන කලකිරී සිටි එලන් ඔහුගෙන් සමුගෙන නැවත ඇගේ කාමරය වෙත යයි.



කාමරයට පැමිණි ඇය එක්වනම දුටු දසුනෙන් බියපත් වන්නට වූයේය.Death චිත්‍රපටයේ වෛද්‍යවරයාගේ ඇඳුමට සමාන අඳුරු ඇඳුමින් සැරසී සිටි වෙස්මුහුණු පැළඳගත් මිනිසෙක් පිහියක් අතින් රැගෙන ඇය වෙත ළඟා වන ආකාරය නෙත ගැටුණු ඇයගේ බිය දෙගුණ තෙගුණ වන්නට විය.



අනේ මාව මරන්න එපා ටූම්බිස්..මට සමාවෙන්න ..
ඇය  සමාව අයැදිමින් හඩ නගන්නට වුවද  ක්ෂණිකව
ක්‍රියාත්මක වූ තියුණු පිහි පහරින් ඇගේ හිස කදෙන් වෙන්ව
යන්නට විය.කපා දැමූ හිස පොළොව මත පතිත විය.




ටුම්බිස් අත් අඩංගුවට ගැනීම සඳහා පොලීසිය සාක්ෂි සොයන අතරවාරයේදී ඔහු ප්‍රසිද්ධියේ ඔහුගේ චිත්‍රපටයේ රංගනයෙහි යෙදෙන තවත් කාන්තා නිළියකට පහර දෙයි.ටුම්බිස්ගේ පහර කෑමට ලක්වූ නිළිය ඝාතනය වී ඇති බැව් සැලවූ පොලිස් නිලධාරීන් එම ස්ථානය වෙත ළගා වූයේය. ඇයද මරණයට පත්ව ඇත්තේ Death චිත්‍රපටයෙහි තවත් දර්ශනයක සදහන් වන ආකාරයටමය.එනම් ඇයගේ කොණ්ඩයෙන් ඇයව නිවසෙහි වහලයෙහි එල්ලා ඇයව මරා දමා ඇති ආකාරය පොලිස් නිලධාරීන් නෙත ගැටෙයි.මේ පිළිබඳව  ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසිය ඔහුගෙන් ප්‍රශ්න කළත් නිශ්චිත සාක්ෂි සොයාගත නොහැකි වූයේය.



චිත්‍රපට දර්ශනයක් රැගත කරන අතරවාරයේ වෙස්මුහුණු මිනිසා ටූම්බිස්ව ෆ්ලේගේ නිවස තුළට ඇදගෙන ගොස් පුටුවකට බැද දමා අත් දෙකට ඇණ ගසා හිංසනයට පත් කරයි.ටූම්බිස් පුළුස්සා මරා දැමීමේ අරමුණින් පසුව ටූම්බිස් බැද දැමූ පුටුව අසල ගින්නක් ඇති කිරීමෙන් අනතුරුව වෙස් මුහුණ පැළඳගත් අබිරහස් මිනිසා පලා යයි.



ටූම්බ්ස් ගින්නෙන් මියගිය බව විශ්වාස කරන ෆ්ලේ පසුව ඔහු තම නිවසේ ටූම්බ්ස්ගේ මරණයේ ජවනිකාව රහසිගතව වීඩියෝ කරන ලද අවස්ථාව නරඹයි . එම වීඩියෝ දර්ශනයේ ටූම්බ්ස් ගින්නෙන් මදක් ඉවතට යන බවක් පෙනෙන්නට තිබේ.ටූම්බ්ස්ගේ සිරුර පිළිස්සී ඇති නමුත් පෙනෙන ආකාරයට බොහෝ දුරට ඔහු ජීවතුන් අතර සිටී.



උඹ ඇයි මාව මරන්නේ .. මොනවද උඹට ඕන ..
සිරුර පිළිස්සීමට ලක්වූ ට්‍රම්බිස් වියරුවෙන් හඩ නගන ආකාරය වීඩියෝ දර්ශන තිරයෙන් ඒලේ නරඹන්නට විය.



ඒලේ තමාගේ මුහුණේ සම ක්‍රමයෙන් ඉවත් කරන්නට වූයේය. සැබෑ මිනිස් මුහුණකම ස්වරූපයට සමාන වූ ඒලේගේ එම මුහුණ ඉවත් වීමත් සමග ඔලිවර් ක්වාල් ගේ සැබෑ රුව දර්ශනය විය.



හි ..හි ..හි .. මට ඕන උනේ උබේ චිත්‍රපටයේ උබේ මරණෝ මගේ අතින්ම ලියන්න ...

යනුවෙන් පැවසූ ඔලිවර් ක්වාල් පිළිස්සී මරණයට පත්වූ ට්‍රුම්බිස්ගේ වීඩියෝ දර්ශනය ක්‍රියාත්මක වූ රූපවාහිනී තිරය නිවා දැමුවේය.





මහමඟ ඝාතකයා
දිනුක හිරුෂාන්



වසංගත මීයන්ගේ දේශය
දිනුක හිරුෂාන්



වියරු ගෑණිය
දිනුක හිරුෂාන්



කලුම කලු
දිනුක හිරුෂාන්


වියරු සුනඛ භීෂණය
දිනුක හිරුෂාන්


අභ්‍යවකාශ භීෂණය
දිනුක හිරුෂාන්


වැම්පයර් දඩයම
දිනුක හිරුෂාන්


තල්මස් දඩයම
දිනුක හිරුෂාන්


හොල්මන් නගරය
දිනුක හිරුෂාන්